# පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
# மாகாண சமூக சேவைகள் திணைக்களம் - வடமத்திய மாகாணம்
# POVINCIAL DEPARTMENT OF SOCIAL SERVICES – NORTH CENTRAL PROVINCE

372, ධර්මපාල මාවත, අනුරාධපුර. இல 372,தர்மபால மாவத்தை, அநுராதபுரம் NO. 372, Dharmapala Mawatha, Anuradhapura

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ<br>பணிப்பாளர்<br>Director | 025 - 2234673 | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 025 - 2224173 | ෆැක්ස්<br>பெக்ஸ<br>Fax | 025 - 2224173 |
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No. | NCP/SS/E1/20 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015/10/ 02 |


<u>පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 06/2015</u>

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ
සියළුම සංවර්ධන සහකාර නිලධාරීන්/ සංවර්ධන නිලධාරී වෙත,

<u>**අනියම් ආපදා ආධාර මුදල් ගෙවීම**</u>

පුද්ගලයාට පාලනය කරගත නොහැකි,සුළු පරිමාණයෙන් සිදු වන,ස්වභාවික විපතකින් තමා පදිංචි එකම නිවසට සිදුවන අලාභ හානියක් හෝ විනාශ වීමකදී විපතට, අනාථ බවට පත්වීම වැළැක්වීම හෝ එවැනි සිද්ධියක් හේතුවෙන් ජීවනෝපාය කර්මාන්තය සඳහා භාවිත ආයුධ හෝ මෙවලම් විනාශ වීමක දී ඒවා සපයා ගැනීම වෙනුවෙන් මෙම දෙපාර්තමේන්තු අනියම් ආපදා ආධාර වැඩසටහන යටතේ ගෙවනු ලබන රු. 10,000.00 ක ආධාර මුදල රු. 20,000.00ක් දක්වා වැඩි කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව පළමු වාරිකය රු. 10,000.00ක් ලෙස හා එම මුදල් වැය කළ ආකාරයේ ප්‍රගතිය මත දෙවන වාරිකය රු. 10,000.00ක් ලෙස මෙම ආධාර මුදල වාරික දෙකකින් ගෙවනු ලැබේ.

03. මෙම අනියම් ආපදා ආධාර මුදල් ගෙවීම සම්බන්ධයෙන් වන විධිවිධාන හා මග පෙන්වීම් පහත පරිද්දෙනි.

1. අනියම් ආපදා ආධාර ලැබීමට සුදුස්සන්
   - හදිසි ගිනි උවදුරක්, වර්ෂාවෙන් නිවස කඩා වැටීම්, ගසක් කඩා වැටීමෙන් සිදු වන හානිය, සුළඟින් සිදුවන හානිය ආදී ස්වභාවයේ වූ හදිසි ආපදාවක් හේතුවෙන් තම නිවස හෝ සිය ජීවනෝපාය කර්මාන්තයට අදාල ස්ථානයට හෝ උපකරණවලට හානි සිදුවී තිබීම
   - මාසික ආදායම රු. 3000ට වඩා අඩු අයකු වීම
   - එම හානිය යටතේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය/ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙතින් වන්දි මුදල් ලබා දීම සඳහා තෝරා ගත් අයකු නොවීම
   - හානි වූ නිවස ඉල්ලුම්කරුට අයත් බව සහ ඔහු එහි පදිංචිව සිටින බව
   - පදිංචියට හානි වූ නිවස හැර වෙනත් ස්ථානයක් නොමැති බව
   - ආධාර ගෙවීමට තරම් අලාභ හානියක් සිදුවී ඇති බව
   - නිවස තනා ගැනීමට ආධාර නොලද හොත් අනාථ භාවයට පත්විය හැකි බව

2. අනියම් ආධාර ලබා දීම ප්‍රතික්ෂේප කෙරෙන අවස්ථා
   - ඉල්ලුම්කරුට නිවසේ අයිතිය නොතිබීම
   - ඉල්ලුම්කරුට පදිංචියට සුදුසු තවත් නිවසක් තිබීම

- පදිංචිව සිටි නිවසක් නොවීම
- අත්හල නිවසක් වීම
- පූජනිය ස්ථාන, වෙළඳ කඩ, ව්‍යාපාරික ස්ථාන, විශ්‍රාම ශාලා ගණයට අයත්වීම
- අනවසර පදිංචි ස්ථානයක් වීම
- කුලී හෝ බදු නිවාසයක් වීම
- කිසිවකු විසින් අලාභ හානි සිදු කල නිවාස
- මුර කුටි හෝ මුර ගෙවල්
- හානිය සිදුවී මාස 6 ක් ඇතුලත වාර්තා කර නොතිබීම.

3. අනියම් ආධාර ගෙවීමේ සීමාවන්
    - හානියේ ස්වභාවය අනුව උපරිම වන්දි මුදල රු. 20,000.00කි

4. අනියම් ආධාර ගෙවීමේ ක්‍රියා පටිපාටිය
    - අලාභය සිදුවූ තැනැත්තා ඒ බව තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිට දැන්වීම.
    - ගිණි ගැනීමකින් සිදු වූ හානියක් නම් පොලිස් වාර්තාව අනිවාර්යයෙන්ම තිබිය යුතුය.
    - ග්‍රාම නිලධාරි නිර්දේශය, සංවර්ධන සහකාර (සමාජ සේවා)/ සංවර්ධන නිලධාරි (සමාජ සේවා) විසින් අදාල අයගේ ස්ථානයට ගොස් තොරතුරු පරීක්ෂා කර බලා අදාල හානිය පිළිබඳ තක්සේරුව හා ඒ පිළිබඳ තම නිර්දේශය සහිත වාර්තාව ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සමගින් පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරිම
    - සමාජ සේවා පලාත් අධ්‍යක්ෂ එම වාර්තාව ස්ථාන පරීක්ෂා කර අදාල හානිය තක්සේරු කර ඉල්ලීම අනුමත කිරීමෙන් පසු අනුමත කළ මුදල සඳහා වන මුදල් ප්‍රතිපාදන වශයෙන් හෝ චෙක්පත් ලෙස අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් යොමු කරනු ලැබේ.
    - අදාළ මුදල් යොදවා අලාභ හානියට පත්වූ නිවාසය පිළිසකර කරන්නේදැයි හෝ අදාල ජීවිකා වෘත්තිය ගොඩ නගා ගන්නේ දැයි සංවර්ධන සහකාර (සමාජ සේවා)/ සංවර්ධන නිලධාරි (සමාජ සේවා) විසින් අධීක්ෂණය කළ යුතුය. එසේ නොකරන්නේ නම් ගෙවූ මුදල් වහාම ආපසු ගෙවන ලෙස අදාල අයට දැන්විය යුතු අතර වෙනත් ආධාර සඳහා ඔවුන් නොසලකා හැරිය යුතුය.
    - පළමු වාරිකයෙන් ඉටු කළ කාර්යය සම්බන්ධයෙන් සංවර්ධන සහකාර (සමාජ සේවා)/ සංවර්ධන නිලධාරි (සමාජ සේවා) විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ සහිත වාර්තාව අනුව ප්‍රාදේශීය ලේකම් අනුමැතිය මත දෙවැනි වාරිකය ගෙවනු ලැබේ.
    - ලබා දුන් වාරිකයෙන් සෑහීමකට පත්විය හැකි පරිදි වැඩ නිම කර හෝ අවම වශයෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය වත් සපයා ගෙන නොමැති නම් ඉතිරි වාරික ගෙවීම් සඳහා නිර්දේශ ඉදිරිපත් නොකළ යුතුය.
    - සුළු පරිමාණ හදිසි ආපදාවක දී විපතට පත්වූවන් අනාථ බවට පත්වීම වැලැක්වීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ආධාර වැඩසටහනකි. මෙය කිසිසේත්ම ජීවන තත්ත්වය වැඩිදියුණු කිරිම අරමුණු කරගත් ආධාර වැඩසටහනක් නොවේ

04. උතුරු මැද පළාත් සභාවේ 2015/08 දරණ අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කරන ලද අංක 2015/36 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

අජන්ත ගුණවර්ධන,
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ,
උතුරු මැද පළාත.

අජන්ත ගුණවර්ධන
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ
උතුරු මැද පළාත